සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**10 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)** | **15 S I,II**

නම: ............................................. **ක්‍රිස්තියානි ධර්මය I** **කාලය පැය තුනයි**

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. යෙසායා දිවැසිවරයාට අනුව මෙසියස් වහන්සේගේ පැමිණීම සිදුවන්නේ ,
 1. පාරාවෝ රජ පරපුරෙනි. 2. දාවිත් රජ පරපුරෙනි.
 3. සාවුල් රජ පරපුරෙනි. 4. සලමොන් රජ පරපුරෙනි.

02. "ලෝකයේ පව් දුරු කරන දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ" ලෙස ජේසුස් වහන්සේව සමාජයට හඳුන්වා දුන්නේ,
 1. ගාබ්‍රියෙල් දේව දූතයා ය. 2. සිමියොන් ය. 3. ස්නාවක ජොහාන්ය 4. සෙකරියස් ය.

03. බලන්න කන්‍යාවක් පිළිසිඳගෙන පුතෙකු බිහි කරන්නීය ........................... යන නම ඔහුට තබන්නේ ය. මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
 1. මෙසියස් ය. 2. එම්මානුවෙල් ය. 3. ක්‍රිස්තුන්ය 4. මෙසායා ය.

04. ජේසුස් වහන්සේගේ නාසරෙත් ධර්ම ශාලාවේ දී සම්පූර්ණ කරනු ලැබුවේ,
 1. යෙසායා දිවැසිවරයාගේ අනාවැකියයි. 2. ආමොස් දිවැසිවරයාගේ අනාවැකියයි.
 3. මීකා දිවැසිවරයාගේ අනාවැකියයි. 4. මලාකි දිවැසිවරයාගේ අනාවැකියයි.

05. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් තම මහළු වයසේ දී දරුවෙකු ඉල්ලා යාච්ඤා කළේ,
 1. සිමියොන් හා අන්නාය. 2. අම්රාම් හා ජොකෙබෙද් ය.
 3. ඊසාක් හා රෙබෙකාය 4. සෙකරියස් හා එළිසබෙත් ය.

06. "ගව ඔරුවක දමා සිටින බිළිඳෙක් ඔබට සම්බවන්නේ ය" එය ඔබට සළකුණකි. මෙසේ පවසන ලද්දේ,
 1. එඬේරුන්ටය. 2. ශාස්තෘවන්තයින්ටය.
 3. හෙරොද් රජුටය. 4. දිවැසිවරයාටය.


07. ජේසුස් වහන්සේ තම සේවය ඉටුකළ සමයේ උත්තම පූජක තනතුර දැරුවේ,
 1. සිරේනියස් ය. 2. කායපස්ය. 3. හෙරොද්ය. 4. පිළාත්ය.

08. දේව හඬ විශ්වාස කිරීමට මැළි වූ සෙකරියස් පූජකතුමා දරුවා ලැබෙන තෙක්,
 1. අන්ධ විය 2. බිහිරි විය 3. ගොළු විය 4. කොරවිය

09. ජේසුස් වහන්සේ සුභාරංචිය ප්‍රකාශ කිරීමේ තම මෙහෙය ආරම්භ කරනු ලැබුවේ,
 1. ජුදය ප්‍රදේශයෙනි 2. ඉතුරිය ප්‍රදේශයෙනි
 3. අබිලෙනය ප්‍රදේශයෙනි 4. ගලීල ප්‍රදේශයෙනි

10. එඬේර සංකල්පය වඩා අර්ථවත් ලෙස ඉදිරිපත් කර ඇති ග්‍රන්ථය වන්නේ,
 1. හිතෝපදේශය ය. 2. ගීතාවලිය ය. 3. මීකාය 4. මලාකිය

11. "නතානියෙල්" ලෙස හඳුන්වනු ලැබු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයා වන්නේ,
 1. මතෙව්ය. 2. පිලිප් ය. 3. තෝමස් ය. 4. බර්තලමෙවුය.

12. 


ඉහත චරිත අතරින් දේව දූත හඬ මඟින් කථා නොකළ චරිතය වන්නේ,
 1. සෙකරියස් ය. 2. එළිසබෙත් ය.
 3. මරියා ය. 4. ජෝසප් ය.

13. ජේසුස් වහන්සේ සීමොන් පේදුරු හමු වූ මුල්ම අවස්ථාවේ දී පැවසූ වදන වන්නේ,
1. මා අනුගාමී වන්න
2. මාගේ බැටළුවන් පෝෂණය කරන්න.
3. මා අනුව එන්න
4. මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇත.

14. ජුදෙව් සමාජයේ යමෙක් පිළිගැනීමේ දී භාවිත කළ සිඹීමේ චාරිත්‍රය ජේසුස් වහන්සේ වෙනුවෙන් භාවිතා කළේ,
1. සීමොන්ගේ නිවසට පිළිගැනීමේ දී ය.
2. නාසරෙත් ධර්ම ශාලාවට වැඩම කළ අවස්ථාවේදීය.
3. ගෙත්සෙමන උයනේ පාවාදීමේදී ය.
4. ජෙරුසෙලම් දෙව්මැදුරට පැමිණි අවස්ථාවේදී ය.

15. පාපයට වැටුණු අයෙකු ඉන්ඉවත් වී දෙවිඳුන් වෙතට එනතුරු බලා සිටින බව කියවෙන උපමා කථාව වන්නේ,
1. නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාවය.
2. නැති වූ කාසිය පිළිබඳ උපමාව
3. මහා මංගල භෝජනය පිළිබඳ උපමාවය.
4. නැති වූ බැටළුවා පිළිබඳ උපමාවය.

16. ධනවතා හා දිළින්දා යන දෙදෙනාම පොදු වූ ධර්මතාව වන්නේ,
1. සමාවයි.
2. මරණයයි.
3. සදාකාල ජීවනයයි.
4. රෝග පීඩාය

17. ජේසුස් වහන්සේගේ ඉගැන්වීමට අනුව අප අපේ සතුරන් කෙරෙහි,
1. වෛරය පැතිරවිය යුතුය.
2. සාමය පැතිරවිය යුතුය.
3. ප්‍රේමයෙන් ක්‍රියා කළ යුතුය.
4. නීතියෙන් දඬුවම් කළ යුතුය.

18. දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වන්නේ ජේසුස් වහන්සේගේ,
1. උපතයි.
2. ස්වර්ගාරෝහණයයි.
3. කුරුස පූජාවයි.
4. නැවත පැමිණීමයි.

19. අත්තිවාරම් දෙක නැමැති උපමාවෙන් අපට උගන්වන්නේ,
1. ගෙයක් සෑදීමේ දී ශක්තිමත් අත්තිවාරමක් දැමිය යුතු බවය.
2. අපගේ ජීවිත දේව වචනය තුළ ගොඩනගා ගතයුතු බවය.
3. අපේ ජීවිත වලට කුනාටු පැමිණෙන බවය.
4. අත්තිවාරම් සවිමත් නැතිවිට ගෙය කඩා වැටෙන බවය.

20. කිතුණු බෞතීස්මයේ දි හිමිවන වරප්‍රසාද පමණක් ඇතුළත් වරණය වන්නේ,
A - ශුද්ධාත්ම බලය ලැබීම
B- සමාජ පිළිගැනීමක් හිමිවීම
C- ශාරීරික පවිත්‍රතාවක් ඇතිවීම
D- පාප නිමාව ලැබීම.
1. A හා B ය.
2. A හා C ය.
3. A හා D ය.
4. B හා C ය.

21. කුඩා අයට බාධා කරන්නන්ට ලැබෙන විපාකය ලෙස ජේසුස් වහන්සේ පැවසුවේ,
1. ඇඹරුම් ගලක් බෙල්ලේ එල්ලා මුදේ හෙළිය යුතු බවයි.
2. කුරුසියේ එල්ලා දැමිය යුතු බවයි.
3. සිංහ ගුහාවේ දැමිය යුතු බවයි.
4. වදකයන්ට භාර දිය යුතු බවයි.

22. ජේසුස් වහන්සේගේ සේවක නායකත්වය ආදර්ශයෙන් පෙන්වූ අවස්ථාවක් නොවන්නේ,
1. කුඩා දරුවෙකු අගය කිරීම
2. ශ්‍රාවකයන්ගේ පාද සේදීම
3. පව්කරුවන් ප්‍රතික්ෂේප කිරීම
4. කුරුස ගසෙහි සිය ජීවිතය පිදීම.

23. ......................... දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීමට වඩා ......................... ට ඉදිකටු මලින් රිංගා යාම පහසුය. මෙහි හිස්තැන් වලට පිළිවෙලින් අදාළ පිළිතුර වන්නේ,
1.දිළින්දෙකුට, ඔටුවකු
2. ධනවතෙකු, ඔටුවකු
3. ඔටුවකු, ධනවතෙකු
4. දිළින්දෙකු . ඔටුවකු

24. පවුල් ජීවිතය තුළ ගැටුම්කාරී තත්වයක් ඇති නොවීමට හේතුවක් වන්නේ,
1. පවුල තුළ පුරුෂාධිපත්‍යය ගොඩනැගීම
2. කාන්තාව විදේශගතවීම
3. පුරුෂයා දුරාචාරකම් වලට ඇබ්බැහි වීම
4. එකිනෙකා වෙත කැපවීමට ඇති කැමැත්ත

25. "හිවලුන්ට බෙනද අහසේ පක්ෂීන්ට කැදලිද ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට හිස තැබීමටවත් තැනක් නැත" ජේසුතුමාගේ මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ,
1. තම මෙහෙය සුව පහසු එකක් නොවන බවය.
2. තම මෙහෙය දුගී දුප්පතුන් උදෙසා කරන්නක් බවය.
3. තමා ඉතා දුගී තැනැත්තෙකු බවය.
4. තමා අනුගාමී වන අය දිළින්දන් විය යුතු බවය.

26. ජේසුතුමාගේ දුක්විදීම හා මරණය පිළිබඳ සත්‍ය අවබෝධ කරගෙන එයට සාක්ෂි දැරුවේ,
1. ජෙරුසෙලමේ ස්ත්‍රීන් ය.
2. මුර සෙබළුන් ය.
3. අරිමාතයේ ජෝසෙප්ය
4. කිරේනියේ සීමොන්ය

27. පිලාත් ආණ්ඩුකාරයා ජේසුතුමා කුරුසපත් කිරීමට තීන්දුව දෙනු ලැබුවේ,
1. බරබ්බස් නිදහස් කිරීමට අවශ්‍ය වූ බැවිනි.
2. ජනතාවගේ ඉල්ලීම ප්‍රබල වූ හෙයිනි
3. නීතියට ගරු කළ යුතු බැවිනි
4. ජේසුතුමා වැරදිකරුවෙකු බව ඔප්පු වූ නිසාය.

28. "ඒකාන්තයෙන්ම සමිදානන් වහන්සේ නැගිට සිටින සේක" මෙසේ ප්‍රකාශ කරන ලද්දේ,
1. මග්දලායේ මරියාය.
2. ගෝලයන් වෙත දිව ගිය පේදුරුය
3. ජෙරුසෙලමේ ස්ත්‍රීන්ය.
4. එම්මාවුස් බලා ගිය ශ්‍රාවකයින් දෙදෙනාය.

29. ජේසුස් වහන්සේ මිනිසත් බව ගෙන මෙලොවට වැඩියේ,
1. පෙරමඟ සකස් කිරීමටය.
2. ලෞකික රාජ්‍යයක් බිහිකරදීම සඳහාය.
3. සාධාරණ සමාජයක් බිහි කිරීමටය.
4. පව්කරුවන් ප්‍රතික්ෂේප කිරීමටය.

30. A-අධිරාජ්‍යයාට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නය
B- උපවාස ප්‍රශ්නය
C- සබත කඩ කිරීමේ ප්‍රශ්නය
D-පුනරුජ්ජීවනය පිළිබඳ ප්‍රශ්නය ය
ඉහත ප්‍රශ්න කිරීම් අතරින් පරිසිවරු විසින් ජේසුස් වහන්සේ අභියෝගයට ලක්කළ අවස්ථා පමණක් දැක්වෙන පිළිතුරු වන්නේ
1. A හා B ය.
2. B හා C ය.
3. A හා C ය.
4. A හා D ය.

31. ජේසුස් වහන්සේ දේව මාළිගාවපවිත්‍ර කිරීම සිදු කරන ලද්දේ,
1. දෙව්මැදුර පවිත්‍රව තිබියයුතු බව හැඟවීමටය.
2. දේව මාළිගාව ගැන තමන් හටද බලයක් ඇති බව පෙන්වීමටය.
3. දෙවිදුන්ගේ ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියා කරන ජුදෙව්වන් අවධි කිරීමටය.
4. ජේසුතුමා දේව මාළිගාව තම පියාගේ ගෘහය ලෙස සැලකූ නිසාය.

32. නිවැරදි දැක්මක් වෙත ගෝලයන් ගෙන ඒමට අදාළ වූ වැදගත් සිද්ධිය වනුයේ,
1. ජේසුස් වහන්සේ පරීක්ෂා ජයගත් අවස්ථාවය.
2. ජේසුස් වහන්සේගේ රූප විපර්යාසය සිදුවූ අවස්ථාවේය.
3. ගෙත්සෙමන උයනේ යාච්ඤා කළ අවස්ථාවේ ය.
4. ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබූ අවස්ථාවේය.

33. පාස්කු මංගල්‍යයට සූදානමක් ලෙස ජේසුස් වහන්සේ විසින් සිදු කරන ලද විශේෂ කාර්ය වූයේ,
1. දේව මාළිගාව පවිත්‍ර කිරීමයි.
2. සමකාලීන සමාජ සිරිත් ඉටු කිරීමයි.
3. විශේෂ භෝජනයක් සූදානම් කිරීමයි.
4. රොටිකැඩීමේ පිළිවෙත ඉටු කිරීමයි.

34. පලස්තීනය තුළ සිටි තම සහෝදර ජනතාව කෙරෙහි අනුකම්පා විරහිතව ක්‍රියාකළ ජන කණ්ඩායම වන්නේ,
1. අයකැමියෝ ය.
2. සමාරිතියෝ ය.
3. ජුදෙව්වන් ය.
4. සාමාන්‍ය ජනයා ය.

35. "ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න" මෙයට පේදුරුගේ පිළිතුර වූයේ,
1.ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ යන්නයි.
2. ඔබ රාජශ්‍රීයෙන් වඩනාකළ මා සිහිකළ මැනව යන්නයි.
3. ඔබ ජුදෙව්වරුන්ගේ රජ නම් ඔබ ඔබම ගළවා ගන්න යන්නයි.
4. ඔබ සමඟ හිරේ යාමට හා මරණය ට වුවද සූදානම්ව සිටියි. යන්නයි.

36. ජේසුස් වහන්සේගේ රළට අප එකතු විය යුත්තේ,
1. අනාගත පෙර නිමිති සම්පූර්ණ කර ගැනීමටය.
2. දේව රාජ්‍යය උරුම කර ගැනීමටය.
3. ලෞකික වාසි ප්‍රයෝජන ලබාගැනීමටය.
4. රෝග පීඩා දුරුකර ගැනීමටය.

37. ජුදෙව් නායකයන් ජේසුස් වහන්සේව විනිශ්චය සඳහා ඉදිරිපත් කළේ,
1. පීඩිත ජනයා වෙනුවෙන් පෙනී සිටි නිසාය.
2. ගලීලයෙන් පැමිණි අයෙකු නිසාය.
3.දේව මාළිගාව පවිත්‍ර කළ නිසාය.
4. තමා දේව පුත්‍රයා බව ප්‍රකාශ කළ නිසාය.

38. සතියේ පළමුවනදා හිමිදිරියේ කාන්තාවෝ සුවඳ ද්‍රව්‍ය රැගෙන සොහොන්ගෙය වෙත ගියේ,
1. උන්වහන්සේගේ උත්ථානය අත් දකිනු සඳහාය.
2. ජුදෙව් චාරිත්‍රයක්ඉටු කිරීම සඳහාය.
3. උන්වහන්සේගේ ප්‍රාතිහාර්ය අත්දකීම සඳහාය.
4. උන්වහන්සේ සම්මුඛ වීම සඳහාය.

39. "නුඹේ දෙවි ස්වාමින් වහන්සේ පරීක්ෂා නොකරන්න." ලෙස ජේසුතුමා පිළිතුරු ලබා දුන්නේ,
1. පළමු පරීක්ෂාවේ දී ය.
2.තෙවන පරීක්ෂාවේ දීය.
3. දෙවන පරීක්ෂාවේ දීය.
4. පරීක්ෂා තනේදීමය.

40. පාසල් කිතුණු ශිෂ්‍යයෙකු ලෙස ඔබේ ප්‍රධානතම වගකීම විය යුත්තේ,
1. කිතුණු දහමේ විශේෂත්වය අන්‍යයන්ට කියා දීමය.
2. තම හැකියා උපරිම ලෙස වර්ධනය කරගැනීමය.
3. අන් අයගේ ක්‍රියා විවේචනය කිරීමයි.
4. කිතුණු ආකල්ප හා අගයන් අනුව සාක්ෂි දැරීමයි.

(1x40=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) පහත දැක්වෙන ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i. ජේසුතුමා බෞතීස්මය ලබා ශුද්ධාත්මයෙන් පූර්ණව පිවිසියේ කුමන ස්ථානයටද ? එහි දී උන්වහන්සේ කුමක් කළේද?
ii. ජේසුස් වහන්සේ මරණින් උත්ථාන කරනු ලැබූ පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.
iii. කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේ භාරදූරකම දැක්වීමට ජේසුස් වහන්සේ පෙන්වා දුන් නිදසුන් 2 නම් කරන්න.
iv. පරිසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය ...................... වන අතර සද්දුසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය .............. විය. මෙහි හිස්තැනට සුදුසු වචනය ලියන්න.
v. මනුෂ්‍ය පුත්‍රයා ප්‍රතික්ෂේප කර කුරුරි ඉරණමක් අත්පත් කර දුන් මොහොතේ සිදුවූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.
vi. ජේසුස් වහන්සේ රාජතේජසින් ජෙරුසෙලමට වැඩම කරන බව ප්‍රකාශ කරන ලද දිවැසිවරයා නම් කර, මෙම ක්‍රියාවලිය තුළින් ඉස්මතු කෙරෙන ගුණාංගය ලියන්න.
vii. ජේසුස් වහන්සේ යාච්ඤාවේ යෙදුණු අවස්ථා 2 ක් නම් කරන්න.
viii. ජේසුස් වහන්සේ ජනතාවට දේශනා කළේ කුමන භාෂාවෙන්ද ? එලෙස උන්වහන්සේ දේශනා කළ ස්ථානයක් නම් කරන්න.
ix. දේව අභිමුඛත්වය සංකේතාත්මක කෙරෙන ශුද්ධ බයිබලයේ සඳහන් සංකේත 2 ක් ලියන්න.
x. වර්තමානයේ කිතුණු සසුන තුළ පවතින ආගමික පිළිවෙත් 2 ක් නම් කරන්න.

(ලකුණු2X10=20)

(02) i. ජේසුස් වහන්සේ මෙහෙවර වෙනුවෙන් පෙරමඟ දූත කාර්යය ඉටු කළේ කවුද? එම සේවය ඉටු කළේ කුමන ස්ථානයක දී ද?
ii. එතුමාගේ අනුශාසනා වලට සවන් දීමට පැමිණි ජන කණ්ඩායම් 3 ක් නම් කර ඔවුන්ට දුන් උපදෙස බැගින් ලියන්න.
iii. එතුමාගේ එම අනුශාසනා මගින් ඔබේ කිතුණු ජීවිතයට ලබාගත හැකි ආදර්ශ 5 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු2+3+5)

(03)i. විශේෂ සේවාවන් සඳහා ජේසුස් වහන්සේ විසින් කැඳවනු ලැබූ පුද්ගල කණ්ඩායම් හැඳින්වූ නම කුමක් ද?
ii. දොලොස්දෙනා පිටත්කර හැරීමේ දී ජේසුස් වහන්සේ ඔවුන්ට පැවරූ කාර්යය 3 නම් කරන්න.
iii. ශ්‍රාවකයන් 12 දෙනා හා 70 දෙනා පිටත්කර හැරීමේ දී ජේසුස් වහන්සේ දුන් උපදෙස් මගින් ඔබේ කිතුණු සේවයට ලබාගත හැකි මඟපෙන්වීම් 5 ක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු2+3+5)

(04) i. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේ වැඩම කළේ කුමන ස්ථානයකට ද? කවුරුන් සමඟ ද?
ii. ජේසුස් වහන්සේ එහි දී තමා සමඟ පැමිණියා වූඅයට ප්‍රකාශ කළේ කුමක් ද?
iii. ජීවිත ගැටළු අවස්ථාවලදී ජේසුස් වහන්සේ මෙන් අන් අයව ධෛර්යමත් කිරීමට ඔබට කළ හැකි දේවල් 5 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු2+3+5)

(05) i. රූප විපර්යාසය සිදු වූයේ කුමන ස්ථානයක දීද ?
ii. එම ස්ථානයට ජේසුස් වහන්සේ ගියේ කුමන අරමුණක් සඳහා ද?
iii. ජේසුස් වහන්සේ සමඟ එම ස්ථානයට ගිය ශ්‍රාවකයන් තිදෙනා නම් කරන්න. එම ස්ථානයේදී සිදු වූ විශේෂ සිද්ධිය ඔබේ වචන වලින් විස්තර කරන්න.

(ලකුණු2+3+5)

(06) i. දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්යය වර්ග කළ හැකි කාණ්ඩ ගණන කීයද? ඒවා නම් කරන්න.
ii. ජේසුස් වහන්සේ විසින් සිදු කළ තෙවන කාණ්ඩයට අයත් ප්‍රාතිහාර්යය සිදුකිරීම් 3 ක් නම් කරන්න.
iii. මහා මංගල භෝජනය පිළිබඳ උපමාවෙන් එළිදැක්වෙන දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති 5 ක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු2+3+5)


(6) WWW.PastPapers.WiKi (5)
Download Term Test Papers, Short Notes From One Place!

(07) පහත මාතෘකා අතරින් 2 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. වපුරන්නාගේ උපමාව
- උපමාව හැඳින්වීම
- දේව රාජ්‍යයේ වර්ධක අවස්ථා
- වර්ධක අවස්ථාවල අර්ථය
- ජේසුස් වහන්සේ උපමාවෙන් අවධාරණය කළ දේ
- උපමාවෙන් ලබාගත හැකි ආදර්ශ

ii. ජේසු බිලිඳුන් කැපකිරීම
- මෙම චාරිත්‍රයට පසුබිම් වූ ඓතිහාසික සිද්ධිය
- කැපකිරීම සිදුකළ අයුරු
- එහිදී සම්මුඛ වූවන්
- ඔවුන් ප්‍රකාශ කළ වදන්
- එම ප්‍රකාශන වල වැදගත්කම

iii. යුදෙව් සමාජයෙන් ප්‍රතික්ෂේප වූවන්
- ප්‍රතික්ෂේප වූ ජන කණ්ඩායම්
- යුදෙව් සමාජය තුළ ඔවුන්ට තිබූ තත්වය
- ඒ අය වෙනුවෙන් ජේසුස් වහන්සේ ක්‍රියාකළ ආකාරය
- අද සමාජය තුළ ප්‍රතික්ෂේපයට ලක්වූවන්
- ඒ අය වෙනුවෙන් අපට කළ හැකි දේ

iv. දේව රාජ්‍යය
- ආධිපත්‍ය / බලය
- රාජකීයත්වය / නායකත්වය
- පුරවැසිභාවය
- නිශ්චිත භූමිසීමාව
- ව්‍යවස්ථාව

PAST PAPERS WIKI



(6) WWW.PastPapers.WiKi (6)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න